# 10 උතුම් බුද්ධ මාතා

මව් ගුණයේ උත්තරීතර ලක්ෂණ මෙන් ම නිවැරැදි නායකත්වයේ හා කැපවීමේ ලක්ෂණ ද මනාව පිළිබිඹු කෙරෙන කාන්තා චරිත පිළිබඳ අවධානය යොමු කිරීමේ දී මහාප්‍රජාපතී ගෝතමී තෙරණියගේ චරිතයට හිමිවනුයේ ඉතා උසස් ස්ථානයකි. අප සමස්ත කාන්තා පරපුරටත් පොදුවේ සියලු දෙනාටත් එතුමියගේ උතුම් චරිතයෙන් ගත හැකි ආදර්ශ බොහෝ ය. එබැවින් මහාප්‍රජාපති ගෝතමී තෙරණියගේ චරිතය පිළිබඳ අධ්‍යයනය කිරීම ඉතා වැදගත් වෙයි.

දඹදිව දෙව්දහ නුවර අංජන රජුගේත් යසෝදරා දේවියගේත් දියණියක ලෙස මහාප්‍රජාපතී ගෝතමිය උපත ලැබුවා ය. එතුමියගේ වැඩිමහලු සොහොයුරිය වූයේ මහාමායා දේවියයි. මහාමායා දේවිය කලුරිය කිරීමෙන් පසු සුද්ධෝදන රජුගේ අගමෙහෙසිය වූයේ මහාප්‍රජාපතී ගෝතමියයි. එතුමියගේ එක ම පුත්‍රයා නන්ද කුමරු ය. ඔහු කිරිමව්වරුන්ට පවරා දුන් එතුමිය සුළු මව ලෙස වැදූ මව සේ ම අපිරිමිත දරු සෙනෙහසකින් සිදුහත් කුමරු හද වඩා පෝෂණය කළා ය.

සිදුහත් බෝසතාණන් වහන්සේ බුද්ධත්වයට පත් වී පළමු වරට කිඹුල්වත්පුරයට වැඩම කළ දින රජ මාලිගයේ දී දෙසූ දහම් අසා මහාප්‍රජාපතී ගෝතමිය සෝවාන් වූවා ය. දෙවන දිනයෙහි ස්වකීය පුත්‍රයා වූ නන්ද කුමරු සසුන්ගත විය. මහා ප්‍රජාපතී ගෝතමිය ද පැවිදි වීමට අදහස් කොට බුදුරදුන් වෙත ගොස් ඒ සඳහා අවසර ඉල්ලූ නමුත් එයට අනුමැතිය නො ලැබුණි.

රෝහිණී නදියෙහි ජලය බෙදගැන්මට නොහැකි ව ශාක්‍ය කෝලිය දෙපිරිස යුද වැදීමට සූදනම් වූහ. එහි දී බුදුරජාණන් වහන්සේ එම කලහය සංසිඳවීමට "කලහ විවාද සූත්‍රය" දේශනා කළහ. එය අසා මහත් සේ පැහැදීමට පත් කුමාරවරු පන්සියයක් දෙනා බුදුරදුන් සමීපයේ පැවිදි වූහ. පසු ව එම කුමාරවරුන්ගේ භාර්යාවෝ ද මහාප්‍රජාපතී ගෝතමිය වෙත ගොස් තමන් ද පැවිදි වීමට කැමති බව පැවසූහ. එවිට මහා ප්‍රජාපතී ගෝතමිය එකී බිසෝවරුන් පන්සිය දෙනා ද සමග බුදුරජාණන් වහන්සේ හමුවට ගොස් වැඳ නමස්කාර කොට කාන්තාවන්ට පැවිද්ද ලබාදෙන මෙන් ආයාචනා කර සිටියහ. බුදුරජාණන් වහන්සේ තව ම කාන්තා පැවිද්ද සඳහා අවස්ථාව නො වන බව දැන 'ගෝතමියනි, බුද්ධ ශාසනයෙහි ස්ත්‍රීන්ට පැවිද්ද නො ඉල්විය යුතු" යැයි වදාළහ. එසේ දෙවැනි තෙවැනි වාරවල ද ආයාචනා කොටත්, ඉල්ලීම ප්‍රතික්ෂේප විය. සිවුවැනි වතාවේ එතුමිය සිය ඉල්ලීම ඉදිරිපත් කිරීමට කැමති නොවූයේ බුද්ධ ගෞරවය හේතු කොටගෙන ය. මෙවර කෙසේ වුවත් පසු අවස්ථාවක දී නැවත ආයාචනයක් කොට පැවිද්ද ලබාගැනීමේ අදහසින් යුක්ත ව එතුමිය ආපසු නික්ම ගියා ය.

එකල්හි බුදු රජාණන් වහන්සේ වැඩ සිටියේ විසාලා මහනුවර ය. මහාප්‍රජාපතී ගෝතමියගේ අදහස වූයේ කාන්තා විමුක්තිය සඳහා පැවිදි වීම අවශ්‍ය ම දෙයක් බවයි. එබැවින් එතුමිය උත්සාහය අත්නොහැර විසාලා මහනුවරට ගොස් නැවත ද බුදුරදුන් හමුවීමට තීරණය කළා ය. පසුව පන්සියයක් බිසෝවරුන් අමතා "දරුවෙනි, අපි තෙවරක් ම පැවිද්ද ඉල්ලා සිටි නමුත් එය නොලද්දෙමු. නැවත වරක් කසාවත් හැඳ පෙරව බුදුරදුන් හමුවීමට ගොස් පැවිද්ද ඉල්ලා සිටිමු. එසේ ගිය විට උන්වහන්සේ අප කෙරෙහි අනුකම්පාවෙන් පැවිද්ද දෙනු ඇතැ"යි, ප්‍රකාශ කළා ය. එම බිසෝවරු ද ඊට කැමැති වූහ.

මහාප්‍රජාපතී ගෝතමිය ප්‍රමුඛ බිසෝවරු හිසකෙස් කපා, කසාවත් හැඳ පෙරව, මැටි පාත්‍ර අතින් ගෙන පා ගමනින් විසාලා මහනුවර බලා නික්මුණහ. ඒ බව ඇසූ ශාක්‍ය කෝලිය රජදරුවෝ ඇපඋපස්ථාන කිරීමටත් රිය සැපයීමටත් ඉදිරිපත් වූහ. එවිට ඔවුහු "අපි මේ රියවලින් ගියෙමු නම්, එය බුදුරජාණන් වහන්සේට අගෞරවයක් වන්නේ යැ"යි, ප්‍රකාශ කොට පා ගමනින් ම විසාලා මහනුවර කූටාගාර ශාලාව වෙත වැඩම කළහ. එහි දී මහාප්‍රජාපතී ගෝතමිය කූටාගාර ශාලාවට ඇතුළු නො වී දොරටුව අසල නතර වී තම පිරිසට මෙසේ ප්‍රකාශ කළා ය.

"මම කලින් තෙවතාවක් ම පැවිද්ද ඉල්ලා සිටියෙමි. එහෙත් පැවිද්ද නොලැබුණි. මෙවර ද පැවිද්ද ඉල්ලා පැමිණි නමුත් ඒ ගැන විශ්වාසයක් නැත. අප බොහෝ දුරකතර ගෙවා මෙහි පැමිණි බව දන් ඉතා ප්‍රසිද්ධ ය. එසේ තිබිය දී මෙවර ද අපගේ ඉල්ලීම ප්‍රතික්ෂේප වුවහොත් බුදුරජාණන් වහන්සේ සුළු මවට ද පැවිද්ද ලබා නො දුන්හයි, උන්වහන්සේටත්, මටත් අවමානයක් විය හැකි ය. එබැවින් මෙහි සිට පැවිද්ද ඉල්ලා යවා අනුමැතිය ලැබුණොත් කූටාගාර ශාලාවට ගොස් බුදුරදුන් දකිමු. අනුමැතිය නො ලැබුණ හොත් නැවත කිඹුල්වත්පුරය බලා යමු." එසේ කියා පණිවුඩය යැවීමට සුදුසු ක්‍රමයක් ගැන සිතමින් සිටියා ය.

එකල්හි ආනන්ද තෙරණුවෝ විහාරයෙන් පිටතට වැඩම කළහ. එවිට ඉදිමුණු පා ඇති ව, දහදියෙන් තෙත්ව ගිය සිරුරු ඇතිව පැමිණ සිටින මහාප්‍රජාපතී ගෝතමිය ඇතුළු පිරිස දැක මෙසේ ඇසූහ.

"මෑණියනි, එහි කිසියම් සතුරු උවදුරෙක් වී ද? මුහුණ පෑ දුකක් පීඩාවක් ඇත් ද? මෙතරම් දුර මගක් ගෙවා කුමක් නිසා මෙහි පැමිණියේ ද?"

එවිට මහාප්‍රජාපතී ගෝතමිය "පුතණුවනි, අනඳ හිමියනි, අපට සිදු වූ විපතක් නැත. මම මෙයට පෙර තෙවතාවක් ම පැවිද්ද ඉල්ලා සිටි නමුත් නොලදිමි. එබැවින් මෙවර පැවිදි වෙස් ගෙන මෙහි පැමිණියෙමි. මෙවර ද එය ඉටු වේ දැයි සැක සහිත හෙයින් විහාරයට නොගොස් මෙහි ම රැඳී සිටින්නෙමි" යි කීවා ය.

ආනන්ද තෙරණුවෝ "මෑණියනි, එසේ නම් මෙහි ම මඳක් විඩා හැර ගනු මැනවි. මම ඔබතුමිය පැමිණ සිටින වග බුදුරජාණන් වහන්සේට දැනුම් දෙන්නෙමි. " බුදුරජාණන් වහන්සේ හමුවට ගිය ආනන්ද තෙරණුවෝ "ස්වාමීනි, මහා ප්‍රජාපතී ගෝතමී දේවිය ඇතුළු පන්සියයක් කාන්තාවෝ පැමිණ සිටිති. ඔවුන්ගේ අදහස පැවිද්ද ලබා ගැනීමයි. එබැවින් කාන්තා පැවිද්ද පිහිටුවා වදරන්නේ නම් මැනවි" යි ආරාධනා කළහ.

එවිට බුදුරජාණන් වහන්සේ " ආනන්දය, ස්ත්‍රීන්ගේ පැවිද්ද ගැන උනන්දු නො වන්න." යැයි වදාළහ. දෙවැනි තෙවැනි වරට ද ඉල්ලීම ප්‍රතික්ෂේප විය. එවිට ආනන්ද තෙරණුවෝ "මා වෙනස් අයුරකින් මෙම ඉල්ලීම සිදු කරන්නේ නම් මැනවැ" යි සිතා මෙසේ ඇසූහ.

"ස්වාමීනි, ස්ත්‍රීන්ට පැවිදි ව මාර්ගඵල ලැබිය නො හැකි ද?"

"ආනන්දය, වීර්යය වඩන්නේ නම් ස්ත්‍රීහු ද මාර්ගඵල ලබන්නාහු ය."

"ස්වාමීනී, එසේ නම් කාන්තා පැවිද්ද අනුදැන නො වදරන්නේ ඇයි?" දැයි ඇසූ ආනන්ද තෙරණුවෝ මහාප්‍රජාපතී ගෝතමී දේවියගේ උදර ගුණය ද වර්ණනා කළහ.

එවිට බුදුරජාණන් වහන්සේ කාන්තා පැවිද්ද පිහිටුවීමට මෙම අයැදීම ම ප්‍රමාණවත් බව සිතා ආනන්ද තෙරණුවන් අමතා, "ආනන්දයෙනි, මහාප්‍රජාපතී ගෝතමිය පැවිදි වනු කැමැත්තී නම්, පෙර බුදුවරයන් වහන්සේලාගේ සමයෙහි ස්ත්‍රීන් මෙන් අෂ්ටගරු ධර්ම පිළිගත යුතු ය. එය ම එතුමියගේ පැවිදි උපසම්පදාව වන්නේ යැයි" ද වදාළහ.

ආනන්ද තෙරණුවන්ගේ දැනුම් දීම මත මහාප්‍රජාපතී ගෝතමිය බුදුරජාණන් වහන්සේ වැඩ සිටි දිසාවට දෙහොත් මුදුන් දී වැඳ, "ස්වාමීනි, ඔබ වහන්සේ යම් ගරු ධර්ම අටක් පනවා වදාළ සේක් ද මම එය හිස්මුදුනින් ම පිළිගනිමි." යැයි තෙවරක් ම කීවා ය. එය ම එතුමියට පැවිද්ද හා උපසම්පදාව විය. සෙසු පන්සියයක් දෙනා ද මහා ප්‍රජාපතී ගෝතමී තෙරණිය අනුව යමින් පැවිද්ද ලැබූහ. අනතුරුව මහාප්‍රජාපතී ගෝතමී තෙරණිය බුදුරජාණන් වහන්සේ වෙතින් කමටහන් ගෙන වීර්යය වඩා නොබෝ කලකින් ම රහත් භාවයට පත් වූවා ය.

බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයේ වැඩ සිටි පසු අවස්ථාවක භික්ෂු භික්ෂුණීන් මධ්‍යයේ දී බුද්ධ මාතාව වූ මහාප්‍රජාපතී ගෝතමී භික්ෂුණිය චිරරාත්‍රඥ (දීර්ඝ කාලීන ශාසනික අත්දැකීම් ඇති) භික්ෂුණීන් වහන්සේලා අතුරෙන් අග්‍රස්ථානයට පත් වන බව වදාළහ. එසේ ම භික්ෂුණී සංඝයාගේ ප්‍රධානත්වයට ද පත් කළහ. මෙයින් පසු යශෝදරා දේවිය ආදීහු ද එතුමිය වෙත පැමිණ පැවිදි වූහ.

එක් කලෙක මහාප්‍රජාපතී ගෝතමී තෙරණිය දැඩි සේ ගිලන් ව මෙහෙණවරෙහි වැඩ සිටියා ය. බුදුරජාණන් වහන්සේ එතුමියගේ සුවදුක් බැලීමට එහි වැඩම කොට ධර්මය ද දේශනා කළහ. පසු ව කලින් පැනවූ විනය නීතියක් ද වෙනස් කරමින් "මහණෙනි, මෙහෙණවරට ගොස් රෝගී වූ භික්ෂුණීන්ට අවවාද දීමට අනුදනිමි"යි වදාළේ උදර මව් ගුණයට කරන ඉහළ ම සැලකීමක් වශයෙනි.

පසු කාලයක මහාප්‍රජාපතී ගෝතමී තෙරණිය උපතින් එකසිය විසි වසරක් වූ තම ආයුෂ පිළිබඳ ව ආවර්ජනා කොට ජීවිත කාලය අවසන් වී ඇති බව දැන ගත්තා ය. පසුව සමවත් සුවයෙන් කාලය ගත කළ එතුමිය බුදුරජාණන් වහන්සේ හමුවට පැමිණ ගාථා රාශියකින් උන් වහන්සේගේ ගුණ වර්ණනා කළා ය.

"ස්වාමීනි මම ඔබ වහන්සේට දුක් වූ දරු සෙනෙහසට වඩා, ඔබ වහන්සේ

ශ්‍රාවිකාවක් ලෙස මට දක් වූ දරු සෙනෙහස දහස් වාරයක් උතුම් ය. මම ඔබ වහන්සේට කිරි දී නළවා සැනසීමි. ඔබ වහන්සේ මා හට අමා කිරි දී සසර දුකින් මුදවා සනසා ලූහ.

" ස්වාමීනි, ඔබ වහන්සේ බුදු වන බව නොදන පුතේ පුතේ යි, ඇමතීමි. රන් බඳුනකට ආහාර ගෙන අනා කවමින් මම ද එයින් අනුභව කෙළෙමි. සිරුර පිරිමදිමින් වැඩුවෙමි. අතපය ඒ මේ අත හරවමින් ඇඳුම් ඇන්දවීමි. අබරණ පැළඳවීමි. එයින් මා ගෙන් වරදක් වී නම් සමාවුව මැනවි."

පිරිනිවන් පෑමට සුදුසු කාලය පැමිණ ඇති බව දත් එතුමිය බුදුරජාණන් වහන්සේගෙන් ඒ සඳහා අවසර ලබා ගත්තා ය. එකල්හි අද බුද්ධ මාතාවෝ පිරිනිවන් පාති යි, ශ්‍රාවකයන් වහන්සේලා අතර ප්‍රසිද්ධ විය. එය ඇසූ අඤ්ඤාකොණ්ඩඤ්ඤ, සාරිපුත්ත, මොග්ගල්ලාන ආදී මහා ශ්‍රාවකයන් වහන්සේලා පිරිවර භික්ෂූන් වහන්සේලා ද සමග කූටාගාර ශාලාවට වැඩම කළහ.

එවිට බුදුරජාණන් වහන්සේ,

"මහණෙනි, මේ බුද්ධ මාතාවෝ සියලු උත්තමයන්ගේ ගෞරවයට හිමිකාරියක් ම වන්නාහ. එබැවින් සැම දෙනා පසුපසින් ගමන් කරමු" යි වදරා ශ්‍රාවකයන් පිරිවරා වෙහෙර දොරටුව දක්වා පසුපස ගමන් කළහ. මෙය බුදුරජාණන් වහන්සේගේ එක ම පසුපස ගමන් කිරීම විය. වෙහෙර දොරටුවේ දී ද ප්‍රජාපතී ගෝතමී තෙරණිය නැවත බුදුරදුන් කරා පැමිණ නමස්කාර කොට "ස්වාමීනි, මේ වනාහි ඔබ වහන්සේගේ අවසාන දර්ශනය වන්නේ ය. මින් පසු ඔබ වහන්සේගේ දර්ශනයක් මට නො ලැබෙන්නේ ය. පිරිනිවන් පෑමට මට අවසර දුන මැනවැ"යි සිරිපතුල් වැන්ද ය. මෙහි දී බුදුරජාණන් වහන්සේ ධර්ම සංවේගය පළ කළහ.

ආනන්ද තෙරණුවෝ ලිච්ඡවී රජවරුන්ගේ ද සහාය ලබා ගෙන එතුමියගේ ආදාහන පූජෝත්සවය උසස් අන්දමින් සිදු කරවූහ.

සමස්ත කාන්තා පරපුරට ම ආලෝකයක් ගෙන දෙමින් භික්ෂුණී සංඝ සමාජය පිහිටුවීමට පුරෝගාමී ව කටයුතු කළ මහා ප්‍රජාපතී ගෝතමී තෙරණින් වහන්සේ එය මනා ලෙස ආරක්ෂා කොට පවත්වා ගෙන යෑමට සෑම අතින් ම කටයුතු කළහ. භික්ෂුණී ප්‍රාතිමෝක්ෂයෙහි එන විනය නීති වැඩි කොටසක් බුදුරජාණන් වහන්සේ විසින් පනවන ලද්දේ ප්‍රජාපතී ගෝතමී තෙරණියගේ අනුදැනුම ඇතිව ය. එතුමිය තමන් වෙත පැමිණි භික්ෂුණීන් හට මැනවින් ධර්මය හා විනය ඉගැන්වූවා ය. මුළු මහත් කාන්තා ලෝකයට ම එතුමියගේ උදාර චරිතය මනා ආදර්ශයක් සපයයි.

ලොව පහළ වූ උතුම් ම සුළුමව ලෙස අපට මෙතුමිය හඳුනා ගත හැකි ය. බුදුරදුන්ගේ සුළු මව වුව ද එතුමිය කිසි විටෙක විශේෂ වරප්‍රසාද බලාපොරොත්තු නො වූවා ය. එසේ වූයේ නම් කාන්තා පැවිද්ද ඉල්ලීම සඳහා මෙතරම් වෙහෙසක් දැරීමට සිදු නො වනු ඇත. අනතිමානී ගුණයෙන් අගතැන්පත් එතුමියගේ අදහස් බෙහෙවින් සාමකාමී විය. එසේ ම ආත්මාර්ථකාමිත්වයෙන් තොර වූ එතුමිය තමා ලද උතුම් සුවය අන් අය අතර ද බෙද දීමට හැම විට ම උත්සුක වූවා ය. එතුමියගේ චරිතය තුළින් මව් ගුණයේ උදාර

ලක්ෂණ මෙන් ම නායකත්වයේ හා කැප වීමේ ලක්ෂණය ද නිරංහංකාරකම ද මේ යැයි මනාව පෙන්නුම් කරයි. අපි බුද්ධ මාතාව වූ මහා ප්‍රජාපතී ගෝතමී තෙරණිය ගෞරවයෙන් සිහි කරමු; වඳිමු; පුදමු. එම චරිතය ආදර්ශයට ගනිමු.

### සාරාංශය

කාන්තා පැවිද්ද ආරම්භ කිරීමෙහි ලා මහාප්‍රජාපතී ගෝතමී තෙරණිය මහත් කැපවීමකින් ක්‍රියා කළා ය. චිරරාත්‍රඥ භික්ෂුණීන් වහන්සේලා අතරෙහි අග්‍රස්ථානය ද ලැබූ එතුමිය බුද්ධ මාතා යන නමින් ද හැඳින්විණ. බුදුරජාණන් වහන්සේගේ හා මහා ශ්‍රාවකයන් වහන්සේලාගේ අප්‍රමාණ ගෞරවයට පාත්‍ර වූ එතුමිය බුද්ධ ශාසනයේ දීප්තිමත් ම ශ්‍රාවිකාව වූවා ය.

### ක්‍රියාකාරකම්




01. මහාප්‍රජාපතී ගෝතමී තෙරණියගේ උදාර චරිතයෙන් ගත හැකි ආදර්ශ හතරක් ගෙන හැර දක්වන්න.

02. මහාප්‍රජාපතී ගෝතමී තෙරණිය භික්ෂුණී සංඝ සමාජය ඇරඹීමෙහි ලා කළ කැප කිරීම පිළිබඳ විස්තරයක් ලියන්න.

03. මහාප්‍රජාපතී ගෝතමී තෙරණිය බුදුරජාණන් වහන්සේගේ ගෞරවයට පාත්‍ර වූයේ කෙසේ ද?

### පැවරුම



අෂ්ට ගරුධර්ම සොයා දනගෙන ඒවා පිළිවෙළින් ලියා පන්තියේ ප්‍රදර්ශනය කරන්න.